



# සමුපකාර ක්‍රමයට කුකුළන් ඇතිකිරීම කළුතර දිස්ත්‍රික්කයේ බිහිවූවකි

භෝග වගාව සඳහා සීමිත ඉඩම් ප්‍රමාණයක් ඇති නගරාසන්න මැත පිටිසර පෙදෙස්වල වෙසෙන ගොවීන්ට විශාල ලාභ ප්‍රයෝජන ලබා ගැනීමට පිළිවන්, නවතම සත්ව පාලන ව්‍යාපාරය බිහිවූයේ කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ගොවිකම් ව්‍යාප්ති කොට්ඨාශයේ ය. සමුපකාර ක්‍රමයට කුකුළන් ඇතිකිරීමේ මෙම ව්‍යාපාරය ගොවිකම් ව්‍යාප්ති නිලධාරි ඒ. බී. ප්‍රනාන්දු මහතාගේ විශේෂ උනන්දුව හේතුකොට ගෙන ඇති වූවකි. පුරා තුන් වසක් පමණ ඉරි ඇද නොයෙකුත් බාධකයන් මහහරවා ව්‍යාපාරය පළමුව ආරම්භ කිරීමට හැකිවූයේ 1963 වර්ෂයේ අවසාන භාගයේ දී ය.

සුළු ව්‍යාපාරයන් සඳහා මූලික ධනයක් උපදවා ගත නොහැකි නාගරික හා ගම්බද උදවියට, ඒ සඳහා සීමා සහිත ණය ප්‍රමාණයක් වෙන්කර දී, ජනතාවට සෙතක් සිදු කිරීමේ අදහස අනුව, මහජන බැංකුවෙන් පිරිනැමෙන ණය මුදලින් මෙම ව්‍යාපාරය ක්‍රියාවේ යෙදෙයි. අනෙකුත් ප්‍රයෝජනයන් ගණනාවක් අතර ට විශාල ආර්ථික ප්‍රයෝජනයක් ද ගෙන දෙන මෙය, ඇත්ත වශයෙන් ම අගනා ව්‍යාපාරයකි.

මහජන බැංකුවේ ණය ආධාරය ඇතිව කුකුළන් ඇතිකිරීමට අදහස් කෙරෙන අය සමුපකාර සමිතියක් සේ සංවිධානය වී, එම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිය ලැබීමෙන් පසු, ඔවුන්ට කුකුල් ගෙවල් සාදගැනීමට, ගෙවලට වුවමනා උපකරණ සපයා ගැනීමට, උසස් පෙළේ දිනක් වයස් හෝ එයට ද මඳ ප්‍රමාණයක් වයසින් වැඩි කුකුල් පැටවුන් හෝ ලබා ගැනීමට සහ එම පැටවුන් ලොකු වී බිත්තර දමන අවස්ථාව දක්වා ආහාර සැපයීම ට ද අවශ්‍ය මුදල් මහජන බැංකුවෙන් ණයට ලබා ගැනීමේ කාර්‍ය්‍යය වටේ මෙම ව්‍යාපාරය ගොඩ නැඟී තිබෙයි. වචනයෙන් සඳහන් කරන විට මෙය ඉතා සුළු වැඩක් ලෙස පෙනෙන්නේ වූ නමුදු මෙ සඳහා ප්‍රනාන්දු මහතා විසින් පළමුව කරන ලද පුරෝගාමී වැඩ කොටස කිසි සේත් සුළුපටු නොවේ. ඔහුට පැනීමට සිදු වූ කඩඉම් සංඛ්‍යාව එකක් දෙකක් නොවෙයි.

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා පානදුර ගොවිකම් ව්‍යාප්ති කොට්ඨාශයේ අරුක්ගොඩ, ගොරකාන, මොරවින්න, තොටවත්ත, හා වාද්දුව යන ස්ථානවටල ප්‍රනාන්දු මහතා විසින් කුකුළන් ඇති කිරීමේ සමුපකාර සමිති පහක් පිහිටුවන ලදී. එයින්, පසුගිය ජූනි මාසයේ ව්‍යාපාරයේ කටයුතු බැලීමට කළුතර දිස්ත්‍රික්කයට අප ගියවිට, සාමාජිකයින් 91ක් දෙනෙකුගෙන් සමන්විත එම සමිති පහෙන්




සමුපකාර ක්‍රමයේ කුකුළන්ට සත්කාර

සාමාජිකයින් 22කු සිටි අරුක්ගොඩ කුකුළන් ඇති කිරීමේ සමිතිය ඉතාමත් දියුණු අඩියක තිබුණේය. එමෙන් ම, අනෙකුත් සමිති පවා අරුක්ගොඩ සමිති යට වඩා එතරම් පසු පිටින් වූයේ නැත.

කුකුළන් ඇති කිරීමේ සමුපකාර සමිතිය වශයෙන් ලියා පදිංචි වීමෙන් පසු ප්‍රනාන්දු මහතාගේ, කළුතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිගේ හා සමුපකාර සහකාර කොමසාරිස් වරයාගේද නිර්දේශ පිට මහජන බැංකුව විසින් එක් සාමාජිකයෙකුට රුපියල් 1,500 බැගින් ණය මුදලක් සමිතියට වෙන්කර දෙන ලදී. මහජන බැංකුවෙන් පිරිනැමෙන එම ණය මුදල පෙරලා ගෙවීම ආරම්භ කළ යුත්තේ ව්‍යාපාරයෙන් ආදයම ලැබෙන විටය. එනම් කුකුළන්ට හයමසක් වයස්ගතවූ විටයි. නිසියාකාරව රැක බලා ගත් උසස් පෙළේ කිකිළියන්ගෙන් සියයට පණහක් දින 180ක් වයස් වූ විට බිත්තර දමන බැවින් හය මස් කාලය ණය ගෙවීම ආරම්භය සඳහා සෑහෙන කාල සීමාවකි.

පානදුර ගොවිකම් ව්‍යාප්ති කොට්ඨාශයේ පිහිටුවා ඇති කුකුළන් ඇති කිරීමේ සමිති පහේ සාමාජිකයින්ගේ කුකුල් ගෙවල් සියල්ල සද ඇත්තේ එකම සැලැස් මකට එකම ද්‍රව්‍ය යොදය. එහි ''ඩීප් ලිටර්'' කුකුල් ගෙවල් වලට වුවමනා උප කරණ, එනම් කෑම භාජන, වතුර භාජන යනාදිය පවා එකම සැලැස්මකට සද



සමිතියේ රැස්කරන ලද බිත්තර ගොඩකි

නිමකර තිබෙයි. මෙම ක්‍රමයට එක් සාමාජිකයෙකුට සපයනු ලබන්නේ පැටවුන් සියයකි. කුකුළ් ගෙය ඊට සෑහෙන තරමට සාද ඇත. එම ගෙවල් ඒ ඒ සමිති විසින්ම ඉදි කර ඇති අතර උපකරණ සාදවා ගෙන ඇත්තේ එකම ස්ථානයෙන්ය.

සාමාජිකයින්ට පැටවුන් වශයෙන් සපයා ඇත්තේ '' හයිලයින් '' නමැති ඉතා උසස් පෙළේ වයිට් ලෙගෝන් දිනක් වයසැති ගැහැණු සතුන් පමණය. උන් එක පැටවෙකුට රු. 2.50ක් මිළවී ඇත. ඒත් සමඟම ඉතා ඉස්තරම් කුකුල් කෑම හය මාසයකට සෑහෙන ප්‍රමාණයන් සපයන ලද්දේය. කුඩා පැටවුන්ට අවශ්‍ය බේත් හේත් ආදියද මේ සමඟ සැපයූ අතර වසංගත රෝගවලින් ආරක්ෂාව ගෙන දීම සඳහා බෙත් එන්නත් කිරීම පළාතේ පශු වෛද්‍ය වරයාගේ මාර්ගයෙන් යථාකාලයේදී ඉටු කරන ලදි. කුකුළන් ඇති කිරීමේ සෑම අවස්ථාවකදීම සාමාජිකයින්ට අවශ්‍ය උපදෙස් ප්‍රනාන්දු මහතා හා ඔහුගේ නිලධාරීන් විසින් ඉටු කරනු ලැබේ. කුකුළන් ඇති කිරීමේ මෙම ව්‍යාපාරයට බැඳීමට පෙර කිසිද ක්‍රමයකට කුකුළන් ඇති කිරීමක් කළ නොමැති සාමාජිකයින් විශාල ගණනාවක් සිටින බැවින් ප්‍රනාන්දු මහතාට උපදෙස් සැපයීමේ කටයුතු විශාල ප්‍රමාණයක් නොකඩවා ඉටු කිරීමට සිදු විය. ඒ අතර, ව්‍යාපාරයේ දියුණුව ගැන බොහෝ දෙනෙක් ඉතා විමසිලිමත්ව බලා සිටි බැවින් ඔහුගේ වගකීම වඩාත් විශාල එකක් විය.

මෙම ක්‍රමයට ඇති කෙරෙන කිකිළියන්ගේ රැක බලා ගැනීම ඉතා උසස් අන්දමින් සිදු වන බැවින් උන් මාස හයට ළඟාවනවිට බිත්තර දැමීම ආරම්භ කරති. කිකිළියන් වැඩෙන මුල් කාලයේදී නැසීයන සතුන් වෙනුවට සතුන්, පැටවුන් සැපයූ වෙළඳ ආයතනය ලවා නොමිළේ සපයා ගැනීමටද ප්‍රනාන්දු මහතා විසින් විධිවිධාන යොද තුබූ බැවින් සාමාජිකයින්ට ලැබුණු පහසුකම් සංඛ්‍යා විශාල විය.

සමුපකාර ක්‍රමයට ඇති කෙරෙන සතුන් සියයකින් දිනකට බිත්තර අසූවක් හෝ එයට වැඩි ගණනක් ලැබෙයි. බිත්තර විශාල ප්‍රමාණයක් දැමීමට සමත් උසස් පෙළපත්වල සතුන් ඇතිකිරීම යහපත් පාලනය සමගම රෝග පීඩාදියෙන් සතුන් ආරක්ෂාකර ගැනීම යනාදිය හේතු කොටගෙන මෙසා විශාල බිත්තර සංඛ්‍යාවක් ලැබෙන්නේය. පානදුර ගොවිකම් ව්‍යාප්ති කොට්ඨා ශයේ සමුපකාර කුකුල් ගොවීන් නිපදවන බිත්තරයකට වැය වන්නේ ශත 10½ක් බව ගණන් බලා තිබෙයි. සමිති විසින් බිත්තර අලෙවි කරනු ලබන්නේ ශත 22ක සාමාන්‍ය මිළකටයි. හැකිතාක් උසස් මිළ ප්‍රමාණයක් ලබා ගැනීමෙන් සාමාජිකයින්ගේ ලාභ වැඩි වන අතර ඔවුන්ගේ ණය පියවා හැරීම පහසු වන බැවින් බිත්තර වැඩිම මිළකට අලෙවි කිරීමට සමිති සියල්ල විශාල පරිශ්‍රමයක් දරයි.

මෙම ව්‍යාපාරය යටතේ සාමාජිකයින් විසින් කිකිළියන් එක් තොගයක් තබා ගනු ලබන්නේ බිත්තර දැමීමට පටන් ගෙන මාස 18ක් ගත වනතුරු පමණයි. මෙම කාල සීමාව ඉක්මවීමෙන් පසු එම කිකිළියන් පට්ටියෙ තබා ගැනීම



මෙම ක්‍රමයට කාන්තාවන්ගේද සහාය තිබෙයි

ආර්ථික නොවන්නේය. ඒ අතරතුර මැහැලි කිකිළියන් වෙනුවට අළුත් සතුන් පට්ටියේ දමා ගැනීම ගැන සාමාජිකයින්ගේ සිත් යොමු විය යුතුවෙයි මහජන බැංකුවේ ණය මුදල ගෙවීමද ඉහතින් සඳහන් මාස 18 කාල සීමාවට සීමා කර තිබෙයි.

ව්‍යාපාරය යටතේ ලියාපදිංචි පරණම සමිති දෙක වන ගොරකාන හා අරුක්ගොඩ සමිති සාමාජිකයින්ගේ සතුන් පසුගිය ජූනි මාසය අවසන් වන විට මාස 9ක් පමණ වයස් විය. එම සමිතිවලින් ඒවන විටද සතුටුදායක ප්‍රතිඵල ලබා තිබුණේය. එවිට සමිති දෙකෙහිම ණය මුදල් පෙරලා ගෙවීම නියමිත ප්‍රමාණයන් ප්‍රමාණයන් ඉක්මවා සිදු කෙරමින් තිබුණි. ඒ අතර, සාමාජිකයින්ගේ ආදයම් ප්‍රමාණයද බෙහෙවින් හොඳ බව පෙණුනි. නිදසුනක් වශයෙන්. ගොරකාන සමිතියේ ගරු ලේකම් අල්විස් මහතා මැයි මාසයේදී නියමිත ණය කොටස් ගෙවා සතුන්ගේ ආහාර බේත් හේත්වල මුදල් පියවා රුපියල් 228ක ආදයමක් ඔහුගේ කිකිළියන් සියයෙන් ලබා තිබුණි. මෙය කුඩා ආදයම් ලබන අයට කෙතරම් වටිනා අතිරේක ආදයමක් දැයි සලකා බැලීම වටී.



2**——ආර් 43 (64/8)

මෙතෙක් විස්තර කෙළේ කුකුළන් ඇති කිරීමේ සමුපකාර ක්‍රමයේ පළමු පියවරයි. එහි දෙවන පියවරද එලෙසම වැදගත් එකකි. එයට බිත්තර දමා 18 මාසයක් ගත වූ, පට්ටියෙන් අස්කරන කිකිළියන් වෙනුවට අළුත් කිකිළියන් සැපයීමේ කාර්‍ය්‍යය නියමිතව තිබෙයි. මේ අවස්ථාවේදී, කූඩු, එනම් ''ඩීප් ලිටර්'' ගෙවල්වලට දැමිය යුත්තේ දිනක් වයස් පැටවුන් නොව බිත්තර දමන කිකිළියන්ය. එසේ කිරීමෙන් සාමාජිකයින්ට නොකඩවා ආදායමක් ලැබෙයි. ව්‍යාපාරය කැඩීමක් නොමැතිව සිදුවෙයි.

එහෙත් එකම ''ඩීප් ලිටර්'' ගෙයක බිත්තර දමන කිකිළියන් හා අළුත් වැඩෙන සතුන්ද දමා ඇති කිරීමට ඉඩකඩ නොමැතිවා මෙන්ම එය නොකට යුතු දෙයකි. ඒ අතර ඒ සඳහා වෙනම ගෙයක් සෑදීම කළ නොහැක්කකි. එමෙන්ම මෙම කාර්‍ය්‍ය පැවරීමෙන් සාමාජිකයින්ට අතිරේක වගකීමක් හා වැඩි වැඩ කොටසක්ද ඇතිවෙයි. අස්කරන කිකිළියන් වෙනුවට අළුත් සතුන් සැපයීමේ කාර්‍ය්‍යය සමිති සංගමයකට පවරා ගැනීමෙන් සාමාජිකයින්ට හා ඒ ඒ සමිති වලටද විශාල පහසුවක් ලැබෙන බව ප්‍රනාන්දු මහතාට පෙනී ගොස් ඇත. එබැවින්, මේ සඳහා මෙම සමිති පහ ''සමිති සංගමයක් සේ'' ලියාපදිංචිවී මහජන බැංකු ණයක් ලබා දිනක් වයස් පැටවුන් මිළ දී ගෙන උන් බිත්තර දමන තෙක් ඇති කර ඒ ඒ සමිතිවල මාර්ගයෙන් ඒවායේ සාමාජිකයින්ට විකිණීමට නියමිතය.



සමුපකාර කුකුල් ගෙවල කටයුතු සියල්ල ඉටුවන්නේ ක්‍රමානුකූලවයි

තෙවන පියවර ආහාර සැපයීමයි. කුකුළන්ට ආහාර සැපයීම අධික වියදම් සහගත දෙයකි. කුකුළ් ආහාර ලාභයට සපයා ගත හැකි නම් බිත්තරවල " නිෂ්පාදන මිළ " පහළ බසී. නිෂ්පාදන මිළ පහළ ගියවිට ලාභය වැඩි වේ. තම සතුන්ට වුවමනා ආහාර තමන්ම නිපදවා ගන්නේ නම් නිෂ්පාදන මිළ නිරායාසයෙන්ම පහළ යයි. එහෙත් කුකුළ් ආහාර සලාකයේ සෑම දෙයක්ම නිපදවා ගැනීම කළ හැකි දෙයක් නොවේ. ඒ නමුත් තමන්ට නිපදවා ගත හැකි ද්‍රව්‍ය පමණක් වත් එලෙස නිෂ්පාදනය කර ගන්නේ නම් එයින්ද බිත්තර " නිෂ්පාදන මිළයෙහි " සැලකිය යුතු අඩුවීමක් ඇති වෙයි.

කුකුළ් ආහාර සලාකයෙන් සියයට 40ක් ගන්නා ධාන්‍ය වර්ගය බඩ ඉරිඟුය. එම ධාන්‍ය වර්ගය පහසුව හා අඩු මිළකට ලබා ගත හැකි නම් බිත්තර නිෂ්පාදන මිළයෙහි අඩුවීමක් ගෙනදිය හැකි බව ප්‍රනාන්දු මහතාට වැටහී ගියේ ය. එබැවින් මෙම සමුපකාර සමිති පහේ සාමාජිකයින්ගේ කුකුළන්ට වුවමනා ධාන්‍ය නිපදවා ගැනීම සඳහා මොනරාගල දිස්ත්‍රික්කයෙන් හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් අක්කර 500ක කැලෑ ඉඩමක් රජයෙන් ලබා ගැනීමට අදහස්ව තිබේ. යෝජිත ගොවිපළේ වැඩ කටයුතු සාමාජිකයින්ගේ නෑදෑයින් විසින් ඉටු කරවීමට අදහස් කර තිබෙයි. මෙසේ කිරීමෙන් උභය පක්ෂයටම ප්‍රයෝජන ලැබේ යයි බලාපොරොත්තු වේ.

සමුපකාර ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වැදගත්කම හා එහි ආර්ථික ප්‍රයෝජනයන් නොබෝ කලකින් ඔප්පුවී ගියෙන් එය කළුතර දිස්ත්‍රික්කයේ අනෙකුත් ව්‍යාප්ති කොට්ඨාශවලද ඇති කරවීමට දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි හෙක්ටර් වික්‍රමසිංහ මහතා කටයුතු සලස්වන ලදී. ඒ අනුව, පසුගිය ජනවාරි මාසයේ දී දකුණු කළුතර ව්‍යාප්ති කොට්ඨාශයේ සාමාජිකයින් 22 කු ගෙන් සමන්විත සමිතියක් පිහිටුවන ලද්දේය. ජූනි අවසානය වන විට එම සමිතියේ සාමාජිකයින්ගේ සතුන්ගෙන්ද සියයට 50 ක බිත්තර සංඛ්‍යාවක් ලබා ගන්නා ලදී. සමිතියේ ප්‍රගතිය සෑම අතින්ම සතුටුදයක බව කොට්ඨාශයේ ගොවිකම් ව්‍යාප්ති නිලධාරි නානායක්කාර මහතා අප සමඟ කීහ. එමෙන්ම ගොවිකම් ව්‍යාප්ති නිලධාරි ජී. සමරනායක මහතා විසින් මැයි මාසයේදී පයාගල ව්‍යාප්ති කොට්ඨාශයේ බේරුවල පිහිටුවන ලද සමිතියේ දියුණුව එමෙන්ම හොඳාකාරව සිදු වෙමින් තිබුණි. සමරනායක මහතාගේ සමිතියෙහි සාමාජිකයින් දස දෙනෙකු සිටිති.

ගොවිකම් ව්‍යාප්ති නිලධාරි ඒ. බී. ප්‍රනාන්දු මහතා විසින් කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ව්‍යාප්ති කොට්ඨාශයෙන් ආරම්භ කරන ලද සමුපකාර ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ කටයුත්ත කළුතර දිස්ත්‍රික්කයෙහි පමණක් නොව දිවයිනේ බොහෝ පෙදෙස්වලටද නොබෝ කලකින් විහිදී යන බවට පෙර නිමිති රාශියක් තිබේ.